**බේස්ලයින් මාර්ග ව්‍යාපෘතිය - අදියර III - 2014**

---------------------------------------------------

බේස්ලයින් මාර්ග ව්‍යාපෘතියේ - අදියර III , 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2009 නොවැම්බර් 19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණය යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------------

මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ - හොරණ මාර්ගයට සම්බන්ධ කිරීම සඳහා කිරුළපන සිට නව මාර්ගයක් ඉදිකිරීම මගින් මාර්ග ප්‍රවාහන තදබදය අවම කර ගැනීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 719 ක් වන අතර, ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යයනය කිරීම අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ කටයුතු 2009 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා

යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද යාවත්කාලීන කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයේ අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම් , මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව. සහ

(ඌ) පෙර වර්ෂයේ මාගේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව .

1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ

තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බවත්‍ය.

2.2 විගණන නිරීක්ෂණ

----------------------

ව්‍යාපෘතිය විසින් අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

----------------------------------------

3.1 අරමුදල් උපයෝජනය

----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | සංශෝධිත අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|
| | | සමාලෝචිත වර්ෂය තුළ | 2014 දෙසැම්බර් 31 දක්වා |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ශ්‍රී ලං ර | 97.00 | 97.00 | 428.6 |
| | 97.00 | 97.00 | 428.6 |

3.2 භෞතික ප්‍රගතිය

---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බේස්ලයින් මාර්ගය වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතියේ III අදියර ලෙස ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියේ කාර්යයන් 2009 වර්ෂයේදී ආරම්භ කර තිබුණද, කිරුළපන සිට කොළඹ - හොරණ මාර්ගයේ දුටුගැමුණු මංසන්ධිය දක්වා නව මාර්ගය ඉදිකිරීමේ ප්‍රගතියක් දක්වා නොතිබුණි. මාර්ගය ඉදිකිරීමේ ප්‍රමාදය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේදී පැවති ගැටලු හේතුවී තිබුණු බව නිරීක්ෂණය විය. තවද ඉඩම් අත්පත් කරගැනීම සහ ඉදිකිරීම් වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් සැලැස්මක් ව්‍යාපෘතිය විසින් පිළියෙල කර තිබුණි.

(ආ) 2009 වර්ෂයේ සිට හෙක්ටයාර් 2.728 ක ඉඩම් කොටස් 143 ක් අත්පත් කර ගැනීමට අපේක්ෂා කර තිබුණද, 2014 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතිය විසින් හෙක්ටයාර් 0.3447 ක ඉඩම් කොටස් 10 ක් පමණක් අත්පත් කර ගෙන තිබුණි. මහා මාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පැහැදිලි කිරීමට අනුව මෙම විශාල ප්‍රමාදය සඳහා බලපෑමට ලක්වූ පුද්ගලයන්ගේ විරෝධතා හේතු වී තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය
---------------------------

ලැබුණු තොරතුරු අනුව, නව මාර්ගය ඉදිකිරීම හේතුවෙන් අවතැන් වූ පුද්ගලයන් සඳහා නිවාස යෝජනා ක්‍රමයක් සැලසුම් කිරීම සඳහා 2008 වර්ෂයේදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට රු.1,175,300 ක මුදලක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගෙවා තිබුණි. කෙසේ වුවද සැලසුම් කටයුතු 2014 දෙසැම්බර් 31 වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. කොළඹ - හොරණ මාර්ගයේ දුටුගැමුණු මංසන්ධිය දක්වා ඉදිකිරීම් වැඩ කපාහැරීම හේතුවෙන් ව්‍යාපෘතියේ විෂය පථය අඩුකර තිබූ හෙයින් එවැනි නිවාස යෝජනා ක්‍රමයක අවශ්‍යතාවය විගණනයේදී නිශ්චය කළ නොහැකි විය.